**ශීර්ෂය 264 - යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/කච්චේරිය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 264 - යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 අගෝස්තු 21 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම**

-------------------

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

---------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 796.90 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඉන් රු.මිලියන 794.05 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 2.85 ක් හෙවත් සියයට 0.36 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 688.87 | 686.02 | 2.85 | 0.41 |
| මූලධන | 108.03 | 108.03 | - | - |
| **එකතුව** | **796.90** | **794.05** | **2.85** | **0.36** |

(ආ) **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත වෙනත් අමාත්‍යාංශ 25 ක් හා දෙපාර්තමේන්තු 19ක් විසින් එකතුව රු.මිලියන 6,603.94 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඉන් රු.මිලියන 6,321.62 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සළසා තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 282.32 ක් හෙවත් සියයට 4.28 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල විෂය අංක 26401 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 52.00 | 51.73 | 40.00 | 43.70 | 200.00 | 121.57 |

## 2.3 පොදු තැන්පත් ගිණුම්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වන තැන්පත් ගිණුම් 08කට අදාළව 2016 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 176.18 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. මිලියන |
| 6000/0000/00/0002/0090/000 | 0.24 |
| 6000/0000/00/0013/0059/000 | 14.44 |
| 6000/0000/00/0014/0006/000 | 23.14 |
| 6000/0000/00/0016/0041/000 | 117.29 |
| 6000/0000/00/0017/0012/000 | 1.49 |
| 6000/0000/00/0018/0053/000 | 5.95 |
| 6000/0000/00/0019/0008/000 | 0.09 |
| 6000/0000/00/0020/0002/000 | 13.54 |
| **එකතුව** | **176.18** |

## 2.4 විගණන නිරීක්ෂණය

යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

## 3.1 ලේඛන හා පොත්පත් නොපැවැත්වීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛන යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය විය.

| | ලේඛණ වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛණය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ආ) | පරිඝනක, උපාංග හා මෘදුකාංග සඳහා වන ස්ථාවර වත්කම් ලේඛණය | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ඇ) | පරිපූරක ලෙජරය | මුදල් රෙගුලාසි 533 |
| (ඈ) | දුරකථන ලේඛනය | මුදල් රෙගුලාසි 845(1) හා 846(3) |
| (ඉ) | උප පත්‍රිකා පොත් ලේඛනය | 5.10 කච්චේරි මාර්ගෝපදේශක අත්පොත |

## 3.2 විසර්ජන ගිණුම

### 3.2.1 අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පුනරාවර්තන වැය විෂයයන් 08 ක් සඳහා සලසා තිබුණු සත්‍ය ප්‍රතිපාදනය රු.55,403,617 ක් සියයට 12 සිට සියයට 71 ක් දක්වා අවස්ථා 13 කදි අඩුකර තිබුණුඅතර තවත් පුනරාවර්තන වැය විෂයයන් 04 ක් සියයට 15 සිට සියයට 73 ක් දක්වා වැඩිකර තිබුණු බවත් නිරීක්ෂණය විය. මූල්‍ය පාලන සැලසුමකින් තොරව වැය ඇස්තමේන්තු පිළියෙල කර තිබුණු බව මේ අනුව නිරීක්ෂණය විය.

(ආ) පුනරාවර්තන වැය විෂයයන් 09 ක් අතර සියයට 15 සිට සියයට 71 ක් වූ රු.2,099,246 ක ප්‍රතිපාදන ඉතිරි වීම් මාරු කිරීම සම්බන්ධයෙන් සෑහීමකට පත්විය හැකි හේතු විගණනයට ඉදිරිපත් නොවීය.

**3.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් සලසා තිබූ ප්‍රතිපාදන**

**පශු සම්පත් සහනාධාර වැඩසටහන - ශීර්ෂය 145**

පශු සම්පත් සහනාධාර වැඩසටහන සම්බන්ධයෙන් සිදුකළ භෞතික පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(අ) පශු සම්පත් සහනාධාර වැඩසටහන අසාර්ථක වීම**

පහත සඳහන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ලබාදුන් පශු සම්පත් සහනාධාර ගෙවීම්වලින් අපේක්ෂිත ඉලක්ක ලඟාකරගෙන නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නම | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | අසාර්ථක වීමට හේතුව |
|---|---|---|
| යාපනය | 09 | පශු සම්පත් මිය යාම |
| වලිකාමම් බටහිර | 06 | පශු සම්පත් මිය යාම |
| වලිකාමම් බටහිර | 04 | නුසුදුසු ගවයින් බෙදාහැර තිබීම |
| වඩමාරච්චි නැගෙනහිර | 06 | පශු සම්පත් මිය යාම |

**(ආ) වෙන්කළ මුදලට වඩා අඩුවෙන් පශු සම්පත් සහනාධාර ලබාදීම**

2016 පෙබරවාරි 16 දිනැති අංක JF/MRS/RES/01/GEN/2016 දරන චක්‍රලේඛය ප්‍රකාරව එක් ප්‍රතිලාභියෙකු සඳහා වෙන්කළ මුදල රු.99,000 ක් වුවත් පහත සඳහන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ඒ වෙනුවට රු.10,000 සිට රු.40,000 ක් දක්වා වූ මුදලක් පශු සම්පත් සහනාධාර ලෙස ගෙවා තිබුණි. මේ අනුව පශු සම්පත් සහනාධාර ගෙවීමේ අපේක්ෂිත ඉලක්ක ළඟා කර ගෙන නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නම | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | චක්‍රලේඛය ප්‍රකාරව වෙන්කළ මුදල | ප්‍රතිලාභීන්ට ලබාදුන් මුදල | ශේෂය |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| යාපනය | 88 | 8,712,000 | 2,470,619 | 6,238,377 |
| වඩමාරච්චි නිරිත | 05 | 495,000 | 334,000 | 161,000 |

**(ඇ) පශු සම්පත් සහනාධාර ප්‍රමාද වී සැලසීම**

පහත සඳහන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ප්‍රතිලාභීන්ට පශු සම්පත් සහනාධාර ලබාදීම ප්‍රමාද කොට තිබුණි. විස්තර පහත දැක්වේ.

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නම | අයිතමයන් ගණන | වටිනාකම | ප්‍රමාද කාලය |
|---|---|---|---|
| | | රු. | (මාස) |
| යාපනය | 46 | 796,050 | 04 |
| වඩමාරච්චි නැගෙනහිර | 13 | 1,299,867 | 02 |
| තෙන්මාරච්චි | 02 | 159,445 | 03 සිට 06 දක්වා |

**3.4 පොදු තැන්පත් ගිණුම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තෙවන පාර්ශවයන්ට ගෙවිය යුතු තාවකාලික රඳවා ගැනීමේ තැන්පතු රු.1,055,964 ක් මාස 09 කට අධික කාලයක සිට කිසිදු පියවරක් නොගෙන පොදු තැන්පත් ගිණුමේ තබා තිබුණි.

(ආ) ආයතන 09 ක් විසින් වියදම් ප්‍රතිපූර්ණය කිරීම සඳහා ලබාදුන් රු.4,351,713 ක් අදාළ වැය විෂයයන්ට කපා හැරීමට හෝ අය කිරීමකින් තොරව පොදු තැන්පත් ගිණුමේ තබා තිබුණි.

**3.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්**

විෂය අංක 26401 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී සේවය අතහැර ගිය සහ විනය ක්‍රියාමාර්ගවලට භාජනය වූ නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.331,925 ක් වූ හිඟ හිටි ශේෂය ඔවුන්ගෙන් අයකර ගැනීමට හෝ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදය ප්‍රකාරව අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

**3.6 වත්කම් කළමනාකරණය**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ අඩුපාඩු පහත දැක්වේ.

**(අ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

කරෙයි නගර් ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල 2013 වර්ෂයේදී පෞද්ගලික ඉඩමක ඉදිකර තිබුණු අතර මෙම ඉඩමෙහි හිමිකාරිත්වය 2017 සැප්තැම්බර් 30 දින වන විටත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, 2016 දෙසැම්බර් 31 දිනට මෙම ගොඩනැගිල්ලෙහි වටිනාකම නිර්නය කිරීම සඳහා සම්බන්ධිත ලිපිගොනුව ද විගණනය වෙත ඉදිරිපත් නොකරන ලදී.

**(ආ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

මෝටර් වාහන 04 ක් වර්ෂ 02 සිට 06 ක් දක්වා කාලයක් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවැතුණි. තවද, මෝටර් බයිසිකල් 24 ක් වර්ෂ 06 කට අධික කාලයක් සිට නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවැතුණි.

**3.7 අනුකූල නොවීම**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ නීති, රීති හා රෙගුලාසි ප්‍රතිපාදනවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| මුදල් රෙගුලාසි 94 | 2,443,148 | බැරකම් සඳහා ස්වාධීන සනාථ කිරීම් ලබාගෙන නොතිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 3.19 වගන්තිය | 458,870 | සේවය කර නැති නිලධාරියෙකු මෙම රෙගුලාසි යටතේ ණයක් ලබාගැනීමට සුදුස්සකු වන අවස්ථාවකදී ඔහුගේ රාජකාරි කටයුතු සහ හැසිරීම් සත්වුදායක බවත්, ඔහු සේවයේ ස්ථිර නොකෙරෙනු ඇතැයි සිතීමට හේතුවක් නැති බවත් දෙපාර්තමේන්තු ප්‍රධානියා සහතික කළ යුතු වුවත්, එවැනි සහතික වීමක් නොමැතිව සේවයේ ස්ථිර කර නොමැති නිලධාරීන් තිදෙනෙකුට ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකක් විසින් ආපදා ණය ගෙවා තිබුණි. |
| **(ඇ) භාණ්ඩාගාර චක්‍රලේඛ** | | |
| 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන චක්‍රලේඛය | - | සමාලෝචිත වර්ෂය සඳහා වූ කාර්යසාධන වාර්තාව චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන ප්‍රකාර පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. |

**3.8 දේශීය මූල්‍යායනය යටතේ වූ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

**ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

**යාපනය මහනගර සභා බල ප්‍රදේශය තුළ කසළ එකතු කිරීම් හා වෙන්කිරීමේ පද්ධතිය**

යාපනය මහනගර සභා කොමසාරිස්වරයා වෙත කසල එකතු කිරීමේ බඳුන් 04 ක් (900 මි.මිX 900 මි.මි. ප්‍රමාණයේ), Trailer Mounted ජංගම කසළ එකතුකිරීමේ පෙට්ටියක් සහ අත් කරත්ත සාදා සැපයීම සඳහා රු.12,105,000 ක් ගෙවා තිබුණි. කෙසේ වුවද, අදාළ කාර්යය 2017 ඔක්තෝබර් 15 දින වන විටත් නිමකර නොතිබුණි.

**3.9 මතභේදයට තුඩුදෙන කරුණු**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හා වලිකාමම් දකුණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැමිණෙන මහජනයා කාර්යාල පරිශ්‍රයේ නවතා තබන බයිසිකලයකින් රු.2 ක සහ මෝටර් බයිසිකලයකින් රු.10 ක නැවතුම් කුලියක් සේවක සුභසාධක සංගම් විසින් පත්කරනු ලැබූ අනවසර පුද්ගලයින් හට අයකිරීමට ඉඩ සලසා තිබුණි. මෙම තත්ත්වය නිවැරදි කිරීමට අදාළ බලධාරීන් විසින් පියවර ගෙන නොතිබුණි.

**3.10 අවිධිමත් ගනුදෙනු**

අනලෙයිතීවු සෙට්ල්මන්ට් පාර (Analaitivu Settlement Road) නැවත සකස් කිරීම සඳහා පුද්ගලික ආයතනයකට එකතු කළ අගය මත බදු (VAT ) වශයෙන් රු. 415,900 ක් ගෙවා තිබුණි. එසේ වුවත්, කොන්ත්‍රාත්කරු විසින් එම එකතු කළ අගය මත බදු වටිනාකම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබුණි. අදාල කොන්ත්‍රාත්කරුගේ VAT ලියාපදිංචි අංකය අක්‍රිය බව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් දැනුම් දී තිබුණි. අනතුරුව ඉහත ඉදිකිරීමට අදාල රඳවාගත් මුදලින් රු.194,087 ක් එකතු කළ අගය මත බදු වශයෙන් ආදායම් ගිණුමට මාරු කර තිබුණු අතර තවදුරටත් කොන්ත්‍රාත්කරුගෙන් අයවිය යුතු රු. 221,813 ක VAT මුදල 2017 අගෝස්තු 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.11 පාඩු හා හානි**

විසර්ජන ගිණුමේ දැක්වෙන වර්ෂ 15 ක සිට වර්ෂ 29 දක්වා වූ කාලයක් විවිධ හේතූන් මත සිදු වූ එකතුව රු.2,403,388 ක් වූ පාඩු, හඳුනාගෙන ගිණුමෙන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

**3.12 විසඳා නොතිබුණු විගණන ඡේද**

දිස්ත්‍රික් ලේකම් කාලර්යාලයට අදාලව විගණකාධිපති වාර්කාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලට පසු විපරම් කටයුතු නිම නොකළ ඡේදවලට අදාල යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2013 | 1.14 | දිස්ත්‍රික් ලේකම්වරයා ඇතුළු නිලධාරීන් 27 දෙනෙකු සඳහා පුද්ගලික මඟී නාවුක සේවා කටයුතුවල නිරත වීම හේතුවෙන් ප්‍රසාද දීමනා ලෙස 2012 මැයි 02 දින රු.මිලියන 3.42 ක මුදලක් ගෙවා තිබුණි. 2009 මාර්තු මස වන විට මෙම නාවුක මඟී සේවාව නවතා දමා තිබුණද ඒ වන විටත් වැටුප්, අතිකාල හා වෙනත් දීමනාවලට අමතරව දිනකට රු.500 බැගින් ගෙවා තිබුණද මෙම නාවුක සේවා කටයුතුවලට අදාලව විශේෂ වූ කාර්යයක් කිසිදු නිලධාරියෙකු විසින් 2012 වර්ෂයේදි ඉටුකර නොතිබුණි. කෙසේ වුවද, 2017 සැප්තැම්බර් 30 දින දක්වා එම නිලධාරීන්ගෙන් එකතුව රු.මිලියන 3.20 ක මුදලක් පමණක් අයකරගෙන තිබුණි. |

**3.13 වැඩියෙන් ගෙවීම්**

(අ) තාර ලීටරයක මිල ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අනුව රු.60 කි. කෙසේ වුවත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සිදු කරනු ලැබූ කර්මාන්ත වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන්ට රු.70 බැගින් ගෙවීම් කර තිබුණි. මේ හේතුකොට ගෙන අවස්ථා 146 කදී කොන්ත්‍රාත්කරුවන්ට රු.2,442,341 ක මුදලක් වැඩියෙන් ගෙවා තිබුණි.

(ආ) පළමුවන හා දෙවන තට්ටුව තාර දැමීම (Coat) සඳහා සම්මත මිල පිළිවෙලින් රු.54ක් සහ රු.33 කි. කෙසේ වෙතත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් නියම කරනු ලැබූ සම්මත මිලට වැඩි වූ විවිධ මිල ගණන් භාවිතා කර තිබුණි. මේ හේතුවෙන් අදාළ කොන්ත්‍රාත්කරුවන්ට රු.2,296,636 ක් 2015 වර්ෂයේදී වැඩියෙන් ගෙවීම් කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නම | අවස්ථා ගණන | වටිනාකම |
|---|---|---|
| | | රු. |
| වඩමාරච්චි නිරිත | 25 | 792,244 |
| තෙන්මාරච්චි | 33 | 135,450 |
| වලිකාමම් බටහිර | 21 | 284,499 |
| නල්ලූර් | 21 | 348,439 |
| වේලනෙයි | 06 | 56,985 |
| වලිකාමම් දකුණ | 20 | 97,885 |
| යාපනය | 21 | 280,125 |
| වලිකාමම් නැගෙනහිර | 10 | 135,696 |
| වඩමාරච්චි උතුර | 07 | 165,313 |
| | 164 | 2,296,636 |

**3.14 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 68 | 49 | 19 |
| (ii) | තෘතියික මට්ටම | 59 | 25 | 34 |
| (iii) | ද්විතියික මට්ටම | 1,260 | 1,003 | 257 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 279 | 188 | 91 |
| | **එකතුව** | **1,666** | **1,265** | **401** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පුරප්පාඩු වූ තනතුරු 401 ක් පිරවීමට හෝ අනුමත සේවක සංඛ්‍යාව යෝග්‍ය ආකාරයට සංශෝධනය කිරීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ii) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ (SLAS) I පන්තියේ නිලධාරියෙකු අනුමත සේවක සංඛ්‍යාවට අතිරික්තව සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුයුක්ත කර තිබුණි. කිසිදු රාජකාරියක් නොපවරා මෙම නිලධාරියාට 2016 අප්‍රේල් 01 දින සිට 2017 ජූලි 31 දින දක්වා රු.1,290,016 ක් ගෙවා තිබුණි.